# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම් කරනු ලබන්නේ කුමන වරායේ පුරප්පාඩු සඳහාද යන්න අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. එක් එක් වරාය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

**තනතුර :** මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරී (ගාල්ල / ත්‍රිකුණාමලය) (Sea Traffic Co-ordinator (Galle / Trincomalee) (පුරප්පාඩු සංඛ්‍යාව : 03)

**(අ) වැටුප :**

| | |
|---|---|
| ශ්‍රේණිය සහ වැටුප් කේත අංකය | : අධි ශ්‍රේණිය – 6. 3 (SG 3) |
| මූලික වැටුප් පියවර | : රු. 53,425/= |
| වාර්ෂික වේතනාධිකය | : රු. 1,150/= |
| (දළ වැටුප මාසිකව | : රු. 132,000/= ක් පමණ වේ.) |

**(ආ) සුදුසුකම් :**

අ. පො. ස ( උ. පෙළ) විභාගය එකවර විෂයයන් තුන ( 03 ) කින් සමත් වීම

සහ

වෙරළාසන්න මුහුදු ගමන්වල ( N.C.V.) යෙදෙන GT 3000 ට නොඅඩු නැව්වල යාත්‍රාපතිවරයෙකු වශයෙන් සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ වලංගු ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජය විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන වලංගු ප්‍රවීණතා සහතිකය හෝ එලෙස පිළිගනු ලැබූ වෙනත් උසස් මට්ටමේ වලංගු ප්‍රවීණතා සහතිකය

හෝ

ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ වෙනත් උසස් මට්ටමේ වලංගු ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජය විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන වලංගු ප්‍රවීණතා සහතිකය

සහ

ගෝලීය සමුද්‍ර ආපද සහ ආරක්ෂක පද්ධති (GMDSS) සහතිකය හෝ ඒ හා සමාන වෙනත් සහතිකය

සහ

ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද රේඩාර් නිරීක්ෂණ සහතිකය හෝ ඒ හා සමාන සහතිකය

සමඟ

**පළපුරුද්ද**

නෞකාවක කාර්යභාර නිලධාරියෙකු ලෙස වසර එක (01) ක සේවා මුර පළපුරුද්ද

**(ඇ) අනෙකුත් අනිවාර්ය අවශ්‍යතා:**

i. අධි උච්ච සංඛ්‍යාත පණිවිඩ හුවමාරු උපකරණ (V.H.F.) උපයෝගී කර ගනිමින් සංඥා නිකුත් කිරීමේ දැනුම හා හැකියාව

ii. ඉංග්‍රීසි භාෂාවෙන් චතුරව කථා කිරීමේ හැකියාව

**(ඈ) වයස් සීමාව :**

අවු. 18 ට නොඅඩු සහ අවු. 45 ට නොවැඩි අය විය යුතුය.

රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.

මෙම තනතුර සඳහා අයදුම්කරන සේවා මුක්ත භටයින්ට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 299 හා 1985.07.23 දින දරන චක්‍රලේඛ ප්‍රතිපාදන අදාළ වනු ඇත.

**තනතුර :** ආධුනික කිමිදුම්කරු (කොළඹ)

(Apprentice Diver (Colombo))

(පුරප්පාඩු සංඛ්‍යාව : 02)

ආධුනික කිමිදුම්කරුවන් ලෙස පුහුණුව සඳහා බඳවා ගනු ලබන අතර, පුහුණුව සාර්ථකව අවසන් කරන ආධුනිකයින් නාවික කිමිදුම්කරු තනතුරට පත්කරනු ලැබේ.

**(අ) වැටුප :**

| | |
|---|---|
| ශ්‍රේණිය සහ වැටුප් කේත අංකය | : තාක්ෂණ – 7:3 (T 3) |
| මූලික වැටුප් පියවර | : රු. 46,665/= |
| වාර්ෂික වේතනාධිකය | : රු. 1,005/= |
| (දළ වැටුප මාසිකව | : රු. 125,330/= ක් පමණ වේ.) |

**(ආ) සුදුසුකම් :**

දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්වීම

සහ

රජයේ හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කළ කිමිදුම් ශිල්පය පිළිබඳ සහතිකය

සහ

ජාතික අධුනිකත්ව මණ්ඩලය හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක යන්ත්‍ර ශිල්පී හෝ පැස්සුම්කරු තුන් අවුරුදු පූර්ණකාලීන සහතික පත්‍රය හෝ යන්ත්‍ර ශිල්පී හෝ පැස්සුම්කරු වෘත්තියට අදාළව හතර වන මට්ටම (NVQ 4) ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය හෝ රජයේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන ඒ හා සමාන සහතිකය.

සමඟ

**පළපුරුද්ද**

රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර තුන (03) ක පළපුරුද්ද

**(ඇ) අනෙකුත් අනිවාර්යය අවශ්‍යතා :**

අවිවාහක විය යුතුයි.

**(ඈ) සටහන**

i. ආධුනිකයින් ලෙස පුහුණුව ලබන කාලසීමාව තුළ T 3 වැටුප් කාණ්ඩයේ ආරම්භක වැටුප් පියවර මත බඳවාගනු ලබන අයකුට හිමිවන වැටුපට ආසන්න අගය දීමනාවක් වශයෙන් ආධුනික කාලය අවසන් වනතුරු මාසිකව ගෙවනු ලැබේ.

ii. තෝරාගනු ලබන අපේක්ෂකයින් කිමිදුම්කරුවන් වශයෙන් සේවයට යොදවා ගැනීමේ යෝග්‍යතාවය නිශ්චය කරනු වස් ඔවුන්ට කිමිදීම පිළිබඳව මාස හය (06) ක පුහුණුවක් ලබාදෙනු ලැබේ. මේ සඳහා නුසුදුසු යැයි හැගෙන අයගේ පුහුණුව අවසන් කරනු ලැබේ. පුහුණු කාලය තුළ කිමිදුම් පිළිබද කුසලතාවයක් දක්වන අපේක්ෂකයින් සේවයේ රඳවාගෙන ඔවුනට නැවත අමතර වසර දෙක හමාර (2 1/2) ක පුහුණුවක් ලබාදෙනු ඇත.

iii. ආධුනික කිමිදුම්කරුවන් වශයෙන් වැඩිදුර පුහුණුව සඳහා රඳවාගනු ලබන අය සතුටුදායක අන්දමින් පුහුණු කාලය සම්පූර්ණ කර ඉන් අනතුරුව අවුරුදු පහ (05) ක කාලයක් අධිකාරියේ නාවික කිමිදුම්කරුවකු වශයෙන් සේවය කරන බවට අධිකාරිය සමඟ බැඳුම්කරයකට හෝ ගිවිසුමකට එළඹීමට අවශ්‍ය කෙරේ.

iv. ඉහත අංක ii හි සඳහන් දීර්ඝ කරන ලද පුහුණු කාලය තුළදී ආධුනිකයින් අධිකාරිය විසින් පවත්වනු ලබන ලිඛිත හෝ ප්‍රායෝගික පරීක්ෂණ සාර්ථක ලෙස නිම කිරීම අවශ්‍ය කෙරේ. පුහුණු කාලය සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව 7:3 (T 3) වැටුප් කාණ්ඩයේ නාවික කිමිදුම්කරු තනතුරට පත්කර T 3 වැටුප් කාණ්ඩයේ වේතනාධික දෙකක් උපයාගැනීමෙන් අනතුරුව හිමිවිය යුතු වැටුප් පියවර මත පිහිටුවනු ලැබේ.

**(ඉ) වයස් සීමාව:**

අවු. 18 ට නොඅඩු සහ අවු. 30 ට නොවැඩි අය විය යුතුය.

රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.

මෙම තනතුර සඳහා අයදුම්කරන සේවා මුක්ත භටයින්ට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 299 හා 1985.07.23 දින දරන චක්‍රලේඛ ප්‍රතිපාදන අදාළ වනු ඇත.

**වෙනත්**

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

iv. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණ අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.

v. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.

vi. රජයේ හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු/ සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතික වල පිටපත් සමඟ ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව සකස් කළ අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2026.09.30 දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වග කියනු නොලැබේ. අදාළ අයදුම්පත් බහලු කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන),**
**මානව සම්පත් සහ පරිපාලන කොට්ඨාශය,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13.**

Gazette.lk